**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.01.14 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 ජනවාරි මස 14 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.ප්‍රදීපා ඉඳුමිණී කුලරත්න මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.තිෂෝක් මැතිතුමා |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2025.12.10 සභා වාර්තාව සභා සම්මත කිරීම.**

2025.12.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ පසුගිය සභා වාර්තාව සම්මත කරන අවස්ථාවේදී සභා වාර්තාව පිළිකුලෙන් යුතුව ප්‍රතික්ෂේප කරන බව පැවසූ බවත්ය.අයවැය කෙටුම්පත සම්මත කරන අවස්ථාවේදී විශේෂ මහා සභාවක් කැඳවා සාකච්ඡා කරනවා යන්න සභා වාර්තාවට ඇතුලත් වී නොමැති බවයි.සියලුම සැලැස්මවල් මෙම සභා වාරයට කල් දැමිය යුතු බවත් මෙම සැලැස්මවල් සම්මත වූයේ කෙසේද යන්න නොදත් බවයි.

ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ සංශෝධනයන් වලට යටත්ව සැලැස්මවල් සම්මත කරගත් බවත් යම් සංශෝධනයක් තිබේනම් ඉදිරිපත් කළ හැකි බවය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ උප සභාපති තුමා හා මම මෙම සැලැස්මවල් ඉදිරි සභා වාරයේදී ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කළ බවයි.එසේ තිබියදී අභිමතය පරිදී සැලැස්මවල් අනුමත කර ඇති බවත්ය.සභාපතිතුමාගේ අත්දැකීම් අඩු බව නිසා මෙසේ කර ඇති බවත් මෙම වාර්තාවල් ඉදිරිපත් නොකළ බවත්,PDF ක් පමනක් ඉදිරිපත් කර ඇති හෙයින් කියවීමට වෙලාවක් නොමැති බවයි.ඔබ තුමාට අවශ්‍යතාවයක් තිබුණානම් විශේෂ මහා සභාවක් කැඳවා අනුමත කරගැනිමට තිබුණු බවයි.දෙසැම්බර් 31ට කලින් සැලැස්මවල් අනුමත කිරීමට අවශ්‍යනම් විශේෂ මහා සභාවක් කැඳවීමට යෝජනාවක් ගෙන ඒමට ඔබට හැකියාවක් තිබුණු බවයි.ඉදිරියේදී මේ ආකාරයෙන් කටයුතු කිරීම සුදුසු බවයි.

2025.12.10 සභා වාර්තාවේ යෝජනා අංක 20 හි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා අදහස් දැක්වීමේදී මෙම ගැටලුව අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට කල ප්‍රකාශය සඳහන් නී නොමැති බව ප්‍රකාශ කරන ලදී.

2025.12.10 සභා වාර්තාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා අංක 01හි අක්කර 50 යන්න අක්කර 30 ලෙස වෙනස් විය යත බවයි.

ඒ අනුව **එම සංශෝධනයන්ට යටත්ව** 2025.12.10 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේද ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

සභික දිමනා ගෙවීමේ දී ගැටළු ඇති වන බැවින් 2025.05.30 වන දින අංක 2438/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති මාලාවේ සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ඇතුලත් 16 වන වගන්තිය පරිදි කිසියම් සභික වරයෙකු සාමාන්‍ය සභා රැස්වීමකට හෝ විශේෂ සභා රැස්වීමකට සහභාගී වීමට නොහැකිවන අවස්ථාවක සභාව වෙතින් නිවාඩු අවසරය ඉල්ලා ඊට අදාළ ලිඛිත ඉල්ලීමක් තමා විසින්ම,සභාපතිවරයා හෝ වෙනත් සභිකවරයෙකු මඟින් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.තවද 42 (3) වගනතිය යටතේ වෛද්‍ය වාර්තාවක් සතියක් ඇතුලත ලබා දිය යුතුය.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

වෛද්‍යය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.ධනේශ් කුමරන් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා එදින සභාවට නොපැමිණි අතර එම මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත නොකරන ලදි.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම- නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01. (I)1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12 වගන්තිය අනුව ප්‍රාදේශිය සභාවේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව සභාවට උපදෙස් දීමේ කාර්යය ඇතුලත් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට ලැබෙන ආදායම් හා වියදම් සමාලෝචනය කිරීමට, උපදෙස් ලබා දීමට ,නව ආදායම් උත්පාදන මාර්ග හඳුනාගැනීමට ඊට අනුශාංගික විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල අනුව කටයුතු කිරීමටත් 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත 25%ක කාන්තා නියෝජනයක් සහිතව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.එම කාරක සභාව සඳහා සාමාජිකයින් සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතු බවත් එම කාරක සභාව ලක්ෂ 05ක් දක්වා ප්‍රසම්පාදන කමිටුව ලෙසද කටයුතු කළ යුතු බවත් ගරු සභාව වෙත යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ අලුත් වර්ෂයකට අයවැයක් ඉදිරිපත් කිරීම සිරිතක් බවත්,2026 වර්ෂයට අයවැයක් ඉදිරිපත් වුණා කියල පිළිනොගන්නා බවත්,මන්ද අයවැයක් ඉදිරිපත් කරන පනත රීති මාලාවට, ක්‍රමවේදයට පටහැනිව කටයුතු කර ඇති බවත්,2020.03.10 දින කෙටුම්පත සාකච්ඡා කිරීමට විධිමත් ලිපියක් ලබා දී ඇති බවත්,එහි කෙටුම්පත සාකච්ඡා කිරීමට කැඳවීමක් ලබා දී ඇති බවත්ය.සභාව අවසානයේ කෙටුම්පත සාකච්ඡා කරනව ඉන්න කියල සභා වාර්තාවක සටහන් වී ඇති බවත්,මෙසේ සභාවක් කරගෙන යන ක්‍රමවේදයක් නැති බවත්,අද සිට කරනු ලබන ගෙවීම් නීත්‍යානුකූලයි කියල නොකියන බවත්,මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමියටත් පළාත් පාලන කොමසාරිස් තුමාටත් පැමිණිලි කර විමර්ෂණයක් යන බවත්,මේ සම්බධයෙන් පිළිතුරක් තවම ලැබී නොමැත.මේ මස 31 වන තෙක් බලා අධිකරණයට යන බවත් එතෙක් මෙම ගෙවීම් වලට සම්බන්ධවන්නේ නැති බවත් විධිමත් අයවැයක් ඉදිරිපත් කරන්නේ නැතිව මෙම ගෙවීම් විගණනයට ලක්වෙතැයි විශ්වාස කරන බවත්ය .කෙටුම්පත සාකච්ඡා කරල අතසන් කළා කියල ව්‍යාජ ලියවිල්ලක් සකස් කර ඇති බවත් අපේ කිසි කෙනෙක් මේ පිළිබඳ දැනුවත් වී නොමැති බවත්ය.මේ සභාවේ කටයුතු වලට ගෙවීම් වලට විරෝධය පළ කර සභාවෙන් පිටවී යන බවත් මන්ද මෙය නීත්‍යානුකූල නොවන හෙයින් වගකීමක් ගත නොහැකි බව ප්‍රකාශ කර පෙ.ව.10.25ට ගරු සභාවෙන් පිටවන ලදි.

**ගරු සභාවෙන් පිටවන ලද ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පහත පරිදී වේ.**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.ප්‍රදීපා ඉදුමිණී කුලරත්න මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |

සභාවෙන් පිටවූ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා නැවත සභා ගර්භයට පැමිණේ යැයි විශ්වාසයෙන් ගරු සභාපතිතුමන් විසින් විනාඩි 30 ක කාලයක් සභාව අඩාළව කල් තබන ලදි.(පෙ.ව.10.27)

විනාඩි 30ක කාලය ඉක්මවූ පසු ගරු සභාවේ සන පූර්ණය සළකා බලා පෙ.ව.10.55ට සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදි.

ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයෙන් පිට වූ හෙයින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සාමාජිකයින් සංශෝධනය විය යුතු බවත්, ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා සභිකයින් 07 දෙනෙකු සහ බාහිර පුද්ගලයින් 02 දෙදෙනෙකුගෙන් යුත් කාරක සභා පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ ඉදිරියේදී නැවත කමිටු සංශෝධනයක් සිදු කළ හැකි බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් පහත නම් සඳහන් සාමාජිකයින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා සුදුස බව යෝජනා කරන ලදි.

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය

බාහිර සාමාජිකයින්

8.ගුරු - ප්‍රේමරත්න කොඩිතුවක්කු මයා
9. විගණන නිලධාරී - පී.ඒ.ප්‍රභාත් ධර්මරත්න මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 01(I)**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය

බාහිර සාමාජිකයින්

8.ගුරු - ප්‍රේමරත්න කොඩිතුවක්කු මයා
9. විගණන නිලධාරී - පී.ඒ.ප්‍රභාත් ධර්මරත්න මයා

01. (II) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව සභාවට උපදෙස් දීමේ කාර්යය ඇතුලත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය , යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳ මහා සභාවට නිර්දේශ ලබා දීමට හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල අනුව කටයුතු කිරීමටත් සමන්විත12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත 25%ක කාන්තා නියෝජනයක් සහිතව කාර්මික සේවා කාරක සභාවක් පත් කළ යුතු බවත්.එම කාරක සභාව සඳහා සාමාජිකයින් සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතු බවත් ගරු සභාව වෙත යෝජනා කරමි.

ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයෙන් පිට වූ හෙයින් කාර්මික සේවා කාරක සභාව සාමාජිකයින් සංශෝධනය විය යුතු බවත්, ඒ අනුව කාර්මික සේවා කමිටුව සඳහා සභිකයින් 07 දෙනෙකු සහ බාහිර පුද්ගලයින් 02 දෙදෙනෙකුගෙන් යුත් කාරක සභාවක් පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ස්ථිර කරන ලදි.

ඒ අනුව පහත නම් සඳහන් සාමාජිකයින් කාර්මික සේවා කාරක සභාව සඳහා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඉන්දික කුමාර මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා

බාහිර සාමාජිකයින්

8.විශ්‍රාමික ඉංජිනේරු - රංජිත් කරුණාතිලක මයා
9.විශ්‍රාමික කාර්මික නිලධාරී - හේමන්ත දංගහදෙණිය මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01(II)**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඉන්දික කුමාර මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
බාහිර සාමාජිකයින්
8.විශ්‍රාමික ඉංජිනේරු - රංජිත් කරුණාතිලක මයා
9.විශ්‍රාමික කාර්මික නිලධාරී - හේමන්ත දංගහදෙණිය මයා

01. (III) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව සභාවට උපදෙස් දීමේ කාර්යය ඇතුලත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන යෝජනා ලබා ගැනීම , ප්‍රමුඛතාගත කිරීම, භෞතික සැලසුම් ,අනවසර ඉදි කිරීම්, අවිධිමත් ජනාවාස නියාමනය කිරීම, ප්‍රජාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධන කටයුතු පිළිබඳ මහා සභාවට නිර්දේශ ලබා දීමට හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල අනුව කටයුතු කිරීමටත් 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත 25%ක කාන්තා නියෝජනයක් සහිතව නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් පත් කළ යුතු බවත්.එම කාරක සභාව සඳහා සාමාජිකයින් සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතු බවත් ගරු සභාව වෙත යෝජනා කරමි.

ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයෙන් පිට වූ හෙයින් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සාමාජිකයින් සංශෝධනය විය යුතු බවත්, ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා සභිකයින් 07 දෙනෙකු සහ බාහිර පුද්ගලයින් 02 දෙදෙනෙකුගෙන් යුත් කාරක සභා පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ස්ථිර කරන ලදි.

ඒ අනුව පහත නම් සඳහන් සාමාජිකයින් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිරිමික දීපාල් මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිශෝක් මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
බාහිර සාමාජිකයින්
8.විශ්‍රාමික කළමනාකරණ සේවා නිලධාරී - ආර්.එම්.රංජනී සිරිසේන මිය
9. විශ්‍රාමික නිවාස සංවර්ධන නිලධාරී - ඩබ්.එච්.කේ.ජයවර්ධන මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01 (III)**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිශෝක් මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
බාහිර සාමාජිකයින්
8.විශ්‍රාමික කළමනාකරණ සේවා නිලධාරී - ආර්.එම්.රංජනී සිරිසේන මිය
9. විශ්‍රාමික නිවාස සංවර්ධන නිලධාරී - ඩබ්.එච්.කේ.ජයවර්ධන මයා

01. (IV) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව සභාවට උපදෙස් දීමේ කාර්යය ඇතුලත් පරිසර සංරක්ෂණය පිළිබඳ කටයුතු, හරිත වැඩසටහන්, ජල සංරක්ෂණ කටයුතු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එනම් පැල්මඩුල්ල ,මාරපන කොට්ඨාශවල මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීමට හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල අනුව කටයුතු කිරීමටත් 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත 25%ක කාන්තා නියෝජනයක් සහිතව පරිසර හා පොදු පහසුකම් කාරක සභාවක් පත් කළ යුතු බවත්.එම කාරක සභාව සඳහා සාමාජිකයින් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතු බවත් ගරු සභාව වෙත යෝජනා කරමි.

ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයෙන් පිට වූ හෙයින් පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සාමාජිකයින් සංශෝධනය විය යුතු බවත්, ඒ අනුව පරිසර හා පොදු පහසුකම් සභාව සඳහා සභිකයින් 07 දෙනෙකු සහ බාහිර පුද්ගලයින් 02 දෙදෙනෙකුගෙන්

යුත් කාරක සභා පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පහත නම් සඳහන් සාමාජිකයින් පරිසර හා පොදු පහසුකම් කාරක සභාව සඳහා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිෂෝක් මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
බාහිර සාමාජිකයින්
8විශ්‍රාමික ගුරු - එච්.බස්නායක මයා
9. ගුරු - ඒ.වී.ලක්මාල් දයානන්ද මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01 (IV)**

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.
1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිෂෝක් මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
5.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා
7.ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී- ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
බාහිර සාමාජිකයින්
8.විශ්‍රාමික ගුරු - එච්.බස්නායක මයා
9. ගුරු - ඒ.වී.ලක්මාල් දයානන්ද මයා

01. (V)පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ කාර්යය හා කර්තව්‍ය උන්නතිය වෙනුවෙන් සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සභිකයින් සහ බල ප්‍රදේශයේ පදිංචි පූජ්‍ය පූජක පක්ෂය,ප්‍රභුවරු, ස්වේච්ඡා සංවිධාන වල නිලධාරීන් හා සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත උපදේශන කාරක සභාවක් පත් කළ යුතු බවත් එම කාරක සභාව සඳහා සමාජිකයින් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතු බවත් ගරු සභාව වෙත යෝජනා කරමි.

ඒ අනුව පහත නම් සඳහන් සාමාජිකයින් උපදේශන කාරක සභාව සඳහා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
5. - රංජිත් කරුණාතිලක මයා
6. - ඇන්ටන් මයා
7. - ටී.කේ.එස්.සුරේෂ් මයා
8. -පාලිත කොතලාවල මයා
9.ගුරු - නිශාන්ත ලේකම්ගේ මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01 (V)**

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ උපදේශන කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1.ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
2.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
4.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
5. - රංජිත් කරුණාතිලක මයා
6. - ඇන්ටන් මයා
7. - ටී.කේ.එස්.සුරේෂ් මයා
8. -පාලිත කොතලාවල මයා
9.ගුරු - නිශාන්ත ලේකම්ගේ මයා

02.2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

ගරු සභාපති - එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
ලේකම් - ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මයා
කාර්මික නිලධාරීන් - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා
-එච්.ජයසිංහ මයා

සභිකයින් -ගරු ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
-ගරු ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
-ගරු එම්.ඒ. පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා
-ගරු බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා
-ගරු කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
-ගරු වී.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා

සභා ගර්භයෙන් පිටවූ මන්ත්‍රීවරුන්ගේ නම් මෙහි සඳහන් වී ඇති බවත් ඔවුන්ගේ එතහතාවය ලබා ගත නොහැකි බැවින් පහත සඳහන් නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සුදුසු බව ගරු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු සභාපති - එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
ලේකම් - ආර්.කේ.කපිල ජගත් ගුණතිලත මයා
කාර්මික නිලධාරීන් - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා
-එච්.ජයසිංහ මයි
සභිකයින් -ගරු ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
-ගරු ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
-ගරු එම්.ඒ. පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා
-ගරු ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
-ගරු ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 02**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව ලෙස පහත සඳහන් සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

ගරු සභාපති - එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
ලේකම් - ආර්.කේ.කපිල ජගත් ගුණතිලත මයා
කාර්මික නිලධාරීන් - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා
-එච්.ජයසිංහ මයි
සභිකයින් -ගරු ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
-ගරු ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
-ගරු එම්.ඒ. පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා
-ගරු ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
-ගරු ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා

03.2025 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන අනුමතව ක්‍රියාත්මක කරන ලද දේවාලෙගම සිගප්පුලිකන්ද සංජීව මහතාගේ නිවස අසළ සිට දුම්මලගස්තැන්න දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාළ බිල්පත වෙනුවෙන් ලද රු.1,674,450.00 මුදල කොන්ත්‍රාත්කරු,සන්නස්ගම ප්‍රජා ජල සංවිධානය වෙත අවාරණ අනුමැතිය යටතේ ගෙවන ලදි.එම ගෙවීම අනුමතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 03**</u>

දේවාලෙගම සිගප්පුලිකන්ද සංජීව මහතාගේ නිවස අසළ සිට දුම්මලගස්තැන්න දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වූ බිල්පතට අනුව අදාළ බිල්පතට අනුව ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය වූ රු.1,674,450.00 මුදල කොන්ත්‍රාත්කරු,සන්නස්ගම ප්‍රජා ජල සංවිධානය වෙත කරනු ලැබූ ගෙවීම සභා සම්මත විය.

04.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ වරිපනම් අංක 11/1 කඩ කාමරය මීට පෙර පැවතියේ තනි කඩ කාමරයක් ලෙසය.නමුත් 2026 වර්ෂයට දේපළ තක්සේරු කිරීමේදී එම කඩ කාමරය කාමර දෙකක් වශයෙන් තක්සේරු කළ අතර එම එක් කඩ කාමරයක් සඳහා ජලය හා විදුලිය ලබා ගැනීමට ජල මීටරයක් හා විදුලි මීටරයක් ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 04**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ වරිපනම් අංක 11/1 කඩ කාමර දෙකෙහි එක් කඩ කාමරයක් සඳහා විධිමත් ක්‍රමවේදය ඔස්සේ ජලය හා විදුලිය ලබා ගැනීමට ජල මීටරයක් හා විදුලි මීටරයක් ලබා දීම සුදුසු බව සභා සම්මත විය.

න්‍යාය පත්‍රයෙහි අංක II. යටතේ ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා එතුමා සභා ගර්භයෙහි නොමැති හෙයින් එම යෝජනා සාකච්ඡාවට බඳුන් නොකරන ලදි.

<u>**III.ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.**</u>

01.නාරංගොඩ වසමේ නිධංගල බෝධිය මාර්ගයේ ඉහළ කොටස කමල් මහතාගේ නිවස අසළ සිට යාපා මහතාගේ නිවස අසළ ඇති අබළං මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05</u>**

මෙම යෝජනාව ලැයිස්තුගතව තබා ගැනීමටත්,අදාළ ප්‍රතිපාදන ලැබුණු පසු මෙම සංවර්ධන කාර්යය සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

02.නාරංගොඩ වසමේ නාරංගොඩත් කුට්ටපිටිය වසමත් යා කරන සපත්තු පාලම පසුගිය වර්ෂා තත්වයත් සමඟ පුපුරාගොස් ඇත.අධික වර්ෂා දිනයන්හිදී මෙහි ගමනාගමනය කළ නොහැකි අතර ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවයට පත්වේ.මෙය ස්ථිර පාලමක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

මෙම යෝජනාව ලැයිස්තුගතව තබා ගැනීමටත්,අදාළ ප්‍රතිපාදන ලැබුණු පසු මෙම සංවර්ධන කාර්යය සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

03. නාරංගොඩ වසමේ හෙට්ටිකන්ද පාසල අසළ සිට නාරංගොඩ උඩ කොටස එනම් නවදගහමුල කොටසට යන මාර්ගයේ එක් ස්ථානයක ඇති බෝක්කුව සංවර්ධනය කර දීම.මෙය ගම්වාසීන්ගේ මූල්‍යාමය දායකත්වයෙන් යම් ප්‍රමාණයක් කර අවසන් උවත් තවත් එහි එක් පසෙකට අඩි 02 විශ්කම්භයකින් හා දිග අඩි 06ක් වන සිලින්ඩර 03ක් යොදා ආරක්ෂිත වැට යෙදීම ඉතිරිව ඇත.එය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ප්‍රතිපාදන තත්වය සළකා බලා සිලින්ඩර 03ක් ලබා දීම සුදුසු බව සභා සම්මත විය.

04.අප කොට්ඨාශය ඇතුළු අනෙකුත් කොට්ඨාශ වල ස්වයං රැකියා කරන කුඩා පරිමාණ නිෂ්පාදකයින් දිරි ගැන්වීමට සතිපොළ නොපවත්වන දිනවල් වෙන් කර දී ඔවුන්ගේ නිෂ්පාදන අළෙවි කිරීමට අවස්ථාවක් සළසා දෙන මෙන් යොජනා කරමි.( මෙයින් ප්‍රාදේශිය සභාවට යම් ආදායමක්ද ලැබේ.)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ සතිපොළ භූමියෙහි අඩුපාඩු සකස් කර සත්තු ඇතුළු වීමේ ඉඩ ප්‍රස්තාව නැති කර,දිවා කාලයේත් රාත්‍රී කාලයේත් දරුවන්ට සෙල්ලම් කිරීමට ඉඩ ප්‍රස්තාව සළසන ස්ථානයකුත් ,විවිධ වර්ගයේ ආහාර ගැනිමට ඇති ස්ථානයකුත් ,උදේ කාලයේ ග්‍රාමීය නිෂ්පාදන අලෙවි සැළකුත් පවත්වාගෙන යාමටත්, රාත්‍රී කාලයේ වින්දනීය පරි ශ්‍රයක් නිර්මාණය කැම අලෙවියත් සමඟ ජනයාට රසවින්දන්යක් ලබා සිය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම කිරීම සුදුසු බවයි.

**<u>තීරණ අංක 08</u>**

සති පොළ භූමියෙහි අඩුපාඩු සකස් කිරීමෙන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ,එම ක්‍රමවේදයට අනුව මෙම කාර්යය සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

05.කුට්ටපිටිය කොට්ඨාශයේ දමිළ ප්‍රජාවගේ වතු කොටසේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා සභාව මැදිහත්ව සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ වතු ආශ්‍රිතව අපිරිසිදු භාවයක් පවතින්නේ ශ්‍රමය නැතිකම,මුදල් නැතිකම නිසා නොව ආකල්ප නොමැතිකම නිසා බවය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා පවසා සිටියේ ගමේ කුණු දාන්න තැනක් නැති නිවෙස් පවත්න බවත්, වතු අධිකාරිය සමඟ සාකච්ඡා කර වත්තෙ ට්‍රැක්ටරය අරගෙන සභාවේ කම්කරුවන්, ගමේ ප්‍රජාවගේ දායකත්වයෙන් මෙම වතු කොටස් පිරිසුදු කිරීමටත්,නීලගම නො.05 පාසල අසල කනත්ත අසළ කුණු දමන බවත්,කුණු දමන මිනිසුන්ට දොස් කීමෙන් පළක් නැති බවත්ය මන්ද ඔවුන්ට කුණු බැහැර කිරීමට ස්ථානයක් නොමැත.කුණු ට්‍රැක්ටරය පෙර මෙම මාර්ගයේ ගමන් කළ බවත්,දැන් කුණු ට්‍රැක්ටරය මෙම මාර්ගයේ නොපැමිනෙන බවයි.මාසයට දෙසරයක්වත් කුණු ට්‍රැක්ටරය කුණු ට්‍රැක්ටරය නීලගම නො.05 කොටසට එවන ලෙසත්,නොදිරන දිරන ලෙස කුණු වෙන් කර ගැනීම සඳහා දැනුවත් කිරීමක් සිදු කරන ලෙසයි.ආරම්භයක් ලෙස නීලගම 05 කොටසේ ශ්‍රමදානයක් සැලසුම් කර එදිනට ප්‍රජාව , ප්‍රාදේශීය සභාව, මහජන සෞඛ්‍යය පරීක්ෂකවරුන් සම්බන්ධ කොට ගෙන පිරිසිදු කිරීම සුදුසු බවයි.තවද කසළ කළමණාකාර කටයුතු භාර විෂය නිලධාරී හට නීලගම නො.05 කොටසට කුණු ට්‍රැක්ටරය යැවීමට කටයුතු කරන ලෙස දන්වන බවද ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මහතා ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා පෙ.ව.11.20ට ගරු සභාවෙන් පිටවන ලදි.

වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව කැමතියි තමන්ගෙ පරිසරය එනම් මිදුල කාණු පද්ධති ,බැමි යොදා ලස්සනට තබා ගැනීමට නමුත් මේවා සිදු කිරීමට වත්ත ඉඩ නොදෙන තත්වයක් තිබෙන බවත්,මෙය සිදු කිරීමට වත්ත ඉඩ දෙන්නෙ නැත්නම් මෙම පහසුකම් වත්ත විසින් සලසා දිය යුතු බවත්ය.මෙ පිළිබඳ වතු අධිකාරිය සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා ගත යුතුය.තවද වතු යටිතල අමාත්‍යාංශය යටතේ සෙවිළි තහඩු ලබා දෙන වැඩසටහන ක්‍රියාත්මක වන බවත් කඩිනමින් පැල්මඩුල්ල කොට්ඨාශයට ලබා ගැනීමට කඩිනම් කර ගැනීමට කටයුතු කරන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

වතු ආශ්‍රිතව ප්‍රජාවට ඉඩම් හිමිකම නැති බවත්, ඉඩම් හිමි වතු වැව්ලි සමාගම් වතු ජනතාවගේ මිනියක්වත් වළ දැමීමට ඉඩ

නොදෙන බවත්,එනිසා වතු සමාගම් කිහිපයක් සමඟ සාකච්ඡා කළ නමුත් වතු සමාගම් වල නඩුවක් පවතින හෙයින්,වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා ,නඩුවේ පාර්ශවකරුවන් අපි එකතු වී මේ පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කළ බවත් ඒ නඩුවේ පැවැත්මට හානියක් නොවන පරිදි දෛනික කටයුතු පවත්වා ගෙන යාමට අවසරයක් ලබා ගැනීමට හැකිද යන්න සොයා බැලීමටත්,එය කඩිනම් කිරීමටත් සම්බන්ධීකරණයේද මෙය සාකච්ඡා වන බවත් ප්‍රාදේශීය සභාවක් ලෙස දිනයක් වෙලාවක් යොදාගෙන අමාත්‍යාංශය වෙත ගොස් සෘජුවම සාකච්ඡා කරන බව ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මහතා ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 09**

කුට්ටපිටිය කොට්ඨාශයේ දමිළ ප්‍රජාවගේ වතු කොටසේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා සභාව මැදිහත්ව සුද්ධ පවිත්‍ර කිරීමටත් කසළ කළමණාකරණය සම්බන්ධයෙන් සියලුම කොට්ඨාශවල දමිළ ජනතාව දැනුවත් කිරීමක් කොට්ඨාශ මට්ටමින් පැවැත්වීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**IV.ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා.**

01.171 B ගොඩගම ග්‍රාම නිලධාරී වසමේ පාතකඩ තුඹදෙණිය හරහා ගොඩගම දෙනවක වත්ත සහ බණ්ඩාරවත්තට පිවිසෙන මාර්ගයේ වානක මහතාගේ නිවස අසළ ගල් අමුණ හරහා දමා ඇති බෝක්කු සහිත මාර්ග කොටස 2025.12.08 දින අධික වර්ෂා තත්වය හේතුවෙන් ගිලා බැස පාර කැඩී අවධානම් තත්වයක පවතියි.ගම්වාසීන් ශ්‍රම දායකත්වය ලබා දීමට කැමතිය.එය පිළිසකර කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය වන සිමෙන්ති,ගල්,වැලි,හියුම්පයිප්ප ලබා දී කඩිනමින් පිළිසකර කිරීමට ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි .

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය පවසා සිටියේ මුදල් අවශ්‍ය නැති බවත් ද්‍රව්‍ය පමණක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 10**

මෙම සංවර්ධනය සඳහා මුදල් ලබා දීමට නොහැකි බවත්, ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ හා ඇස්තමේන්තු හා ප්‍රතිපාදන තත්වය සළකා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**V.ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.**

01.නො. 02 කොටසේ කොළණිය උඩ කොටස පිවිසෙන මාර්ගයේ මුල කොටසේ ඇති මැණික් ඉල්ලම වෙන්දේසි කිරීම සුදුසු බවට කාර්මික සේවා කමිටුවෙන් නිර්දේශ කරන ලද අතර ඒ සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 11**

කාර්මික සේවා කමිටු යෝජනාව සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමියගෙන් උපදෙස් ලබා ගැනීමටත්,ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා පෙ.ව.11.45ට නැවත ගරු සභාවට පැමිනෙන ලදී.

02. මොරතොට ඉසුරු මාවතේ නිළමේ මහතාගේ නිවස අසළ බෝක්කුව ඉවත්කර කුඩා පාලමක් ඉදිකිරීමට අවශ්‍ය බැවින් එම ස්ථානයේ ඇති මැණික් ඉල්ලම ප්‍රසිද්ධ වෙන්දේසියකට ඉදිරිපත් කිරීම සුදුසු බවට කාර්මික සේවා කමිටුවෙන් නිර්දේශ කරන ලද අතර ඒ සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 12**

කාර්මික සේවා කමිටු යෝජනාව සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමියගෙන් උපදෙස් ලබා ගැනීමටත්,ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බව සභා සම්මත විය.

03.2025.1.29 දින කාර්මික හා සේවා කමිටු නිර්දේශ අංක 04ට අනුව RW 9999 ජල බවුසරය හා RV5835 ටේලරය අලුත්වැඩියා කිරීම යාන්ත්‍රික ඉංජිනේරු විසින් ඵලදායී නොවන බව නිර්දේශ කර ඇති බැවින් ඒ සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 13**

භාණ්ඩ සමීක්ෂණයෙන් RW 9999 ජල බවුසරය හා RV5835 ටේලරය අබළි ද්‍රව්‍ය ලෙස වර්ගීකරණය වූ පසු යාන්ත්‍රික ඉංජිනේරු තක්සේරුවක් ලබා ගෙන RW 9999 ජල බවුසරය හා RV5835 ටේලරය ප්‍රසිද්ධ වෙන්දේසියකට එළඹීම සුදුසු බවට සභා සම්මත විය.

**VI.ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමාගේ යෝජනා.**

01.මාවුදැල්ල ග්‍රාමසේවා වසමේ වේ ගඟට දමා තිබූ පනගම පාලම 2003 ගංවතුරට ගැලවී ගඟට වැටී ඇත.එය අඩි 04ක් පළල පමණ කුඩා එකක් වන අතර එය ගඟේ දිරා පත්වෙමින් පවතී.එම පාලම ගොඩට ගෙන කොටසක් පනගම දෙදොළ පාරේ ඉහල කිරිවැල් කැටිය දොළ හරහා යන අඩි පාර සඳහා සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

02.ගල් ඉන්න ග්‍රාමසේවා වසමේ කිරිවැල්දෙනි පන්සලට යන අතුරු පාර හරහා වතුර බැසීමට දමා ඇති හියුම් පයිප්ප වල ප්‍රමාණය කුඩා බැවින් අධික වැසි දිනවල පාරේ වතුර පිරෙන නිසා ඒ සඳහා ලොකු හියුම් පයිප්ප යොදා කාණුව සුද්ධ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොට්ඨාශ වල හියුම්පයිප්ප වල අවශ්‍යතාවයන් හඳුනාගෙන කාර්මික නිලධාරී වාර්තාවක් සමඟ ලැයිස්තුවක් ලබා දීම තුලින් එකවර හියුම්පයිප්ප ගෙන්වා ගැනීමට හැකි බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 15</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව,ප්‍රතිපාදන තත්වය සළකා බලා හියුම් පයිප්ප ලබා දීම සුදුසු බවට සභා සම්මත විය.

03.මාවුදැල්ල ග්‍රාම සේවා වසමේ පනගම හන්දියෙන් පහළට ඇති මාර්ගයේ වංගු 2ක අඩි 03ක් පමණ පළලට කොන්ක්‍රීට්කර විශාළ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 16</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

**VII.<u>ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

01.පොළ භූමියෙහි සෑම මසකම දින 04ක් හෝ 03ක් වීදි කෑම අළෙවිසැළක් පැවැත්වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

සති පොළ භූමියෙහි අඩුපාඩු සකස් කිරීමෙන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ,එම ක්‍රමවේදයට අනුව මෙම කාර්යය සිදු කිරීම සුදුසු බවට සභා සම්මත විය.

02.කසළ කළමණාකරණ කටයුතු වෙනුවෙන් වසම් මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කර දෙන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගම් මට්ටමේ ජනයා කසළ වෙන් කිරීම සම්බන්ධයෙන් දැනුවත් වීමක් නොමැති බවත්,එම ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ගම් මට්ටමින්,වසම් මට්ටමින් ,කොට්ඨාශ මට්ටමින් ප්‍රජාව දැන්වත් කිරීමේ වැඩසටහනක් සිදු කිරීමට හැකිනම් ඒ වෙනුවෙන් කාලය, ශ්‍රමයෙන් දායකත්වය ලබා දිය හැකි බවත්,එම දැනුවත් කිරීම් සිදු කිරීමෙන් පසුව කසල කළමණාකරණ ක්‍රියාන්විතය ඉදිරියට රැගෙන යාමටත් දැනුවත් කිරීමකින් තොරව මෙය කළ නොහැකි බවත්,තමන්ගේ කොට්ඨාශ වල ජනතාව සහභාගී කර දෙන ලෙසත් දිනයක් වෙලාවක් වෙන් කර දෙන ලෙස මෙම සභාවේ සියලු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියනගෙන් ඉල්ලා සිටින ලදි.අවශය වන්නේ ඉන්න තැනක් පමණක් බවත්, අවශ්‍ය තාක්ෂණික උපකරණ ,දැනුම ලබා දීමට හැකි බවත්,දැන්වත් කිරීමට පැයක පමණ කාලයක් අවශ්‍ය බවත්ය.කසළ ටොන් 06ක් වන කසළ ප්‍රමාණය ටොන් 04ක් දක්වා අඩු කර ගැනීම ඉලක්කය බවයි.මෙයට සහයෝගය ලබා දෙන්න දැනුවත් කිරීමට අවශ්‍ය මූලික පහසුකම් ලබා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ 2026 වර්ෂය යනු කසළ වර්ෂය හැටියට නම් කළ යුතු බවත්,2025 වර්ෂයේ සභා කටයුතු ආරම්භ කළ නමුත් මේ සම්බන්ධයෙන් සාධනීය කිසිවක් සිදු කිරීමට නොහැකි බවයි.මෙම විෂය සම්බන්ධයෙන් ගරු ගයාන් පුෂ්පකුමාර මැතිතුමා දැනුවත් වීමක් ඇති බැවින් සෙසු කටයුතු වලින් බැහැර කර කසළ කළමණාකරණය යන විෂය පමණක් සිදු කරන ලෙසයි.මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ ග්‍රාම නිලධාරී වසමේ තරුණ පිරිස් වයස අවු.60ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්,කාන්තාවන් සම්බන්ධ කරගෙන කසළ පිළිබඳව නව කතිකාවතක් ඇති කර ගත යුතු බවය.මෙයට සැලැස්මක් සකසා ගත යුතුය.පළවන අදියර ලෙස ග්‍රාම නිලධාරී වසමකට ගොස් ආදර්ශයක් ලෙස කසළ කළමණාකරණ වැඩසටහනක් සිදු කිරීමටත් සිදු කිරීම සුදුසු බවයි.සභාවේ මුළු ශක්තියම මේ සඳහා යොදවන බවත්,සභාවේ සේවක මණ්ඩලයත්, මන්ත්‍රීවරුන් , ප්‍රදේශයේ ජනතාවසම්බන්ධ කරගෙන ආදර්ශ කසළ කළමණාකරණ ගම්මානයක් නිර්මාණය කිරීම මූලිකව සිදු කළ යුතු බවයි.පෙබරවාරි මාසයේ නියම ව්‍යාපෘතියක් ලෙස මෙය සිදු කිරීම සුදුසුය.

**<u>තීරණ අංක 18</u>**

පරිසර හා පොදු පහසුකම් කමිටුව හරහා සාකච්ඡා කොට කසළ කළමණාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වසම් මට්ටමින් විධිමත් සැලැස්මක් සකස් කිරීමටත්,මූලික පියවර වශයෙන් එක් ග්‍රාම නිලධාරී වසමක් තෝරාගෙන ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්,වෙනත් රජයේ ආයතන වල නිලධාරීන්,ගරු මන්ත්‍රීවරුන්,ප්‍රජාව ගේ සහභාගීත්වයෙන් කසළ කළමණාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සුදුසු බව සභා සම්මත විය.

න්‍යාය පත්‍රයයෙහි අංක VIII, IX, X, XI, XII, XIII යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වරියන්

සභා ගර්භයෙහි නොමැති හෙයින් එම යෝජනා සාකච්ඡාවට බඳුන් නොකරන ලදි.

තවද න්‍යාය පත්‍රය ඔබ වෙත යොමු කිරීමෙන් පසුව කාර්යාලයට ලද ලිපි වලට අදාළ යෝජනා හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කරන බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

**හදිසි යෝජනා.**

**<u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01.ප්‍රධාන අමාත්‍යාශ අරමුදලින් වතු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සේපාලිකා කඩය අසළ සිට ලැයිම පිටුපසින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ රු.1,566,616.41 මුදල කොන්ත්‍රාත්කරු ,වැල්අඳුරාගොඩ එක්සත් අවමංගල්‍යාධාර සහන සේවා සමිතිය, වැල්අඳුරාගොඩ,ගනේගම,පැල්මඩුල්ල වෙත ගෙවීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

ප්‍රධාන අමාත්‍යාශ අරමුදලින් වතු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සේපාලිකා කඩය අසළ සිට ලැයිම පිටුපසින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ රු.1,566,616.41 මුදල කොන්ත්‍රාත්කරු ,වැල්අඳුරාගොඩ එක්සත් අවමංගල්‍යාධාර සහන සේවා සමිතිය, වැල්අඳුරාගොඩ,ගනේගම,පැල්මඩුල්ල වෙත ගෙවීම සුදුසු බවට සභා සම්මත විය.

02.2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සිංගප්පුලිකන්ද අමුණ මාර්ගයේ පාලම දෙපස සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ වැඩ අවසන් බිල්පත වෙනුවෙන් ලද රු.1,244,455.99ක මුදල කොන්ත්‍රාත්කරු ,සිතමු සම්පත් ගොවි සංවිධානය, දේවාලෙගම,පාතකඩ වෙත ගෙවීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 20</u>**

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සිංගප්පුලිකන්ද අමුණ මාර්ගයේ පාලම දෙපස සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ වැඩ අවසන් බිල්පත වෙනුවෙන් ලද රු.1,244,455.99ක මුදල කොන්ත්‍රාත්කරු ,සිතමු සම්පත් ගොවි සංවිධානය, දේවාලෙගම,පාතකඩ වෙත ගෙවීම සුදුසු බවට සභා සම්මත විය.

03.දිට්වා සුළිකුණාටුව නිසා විපතට පත් ජනතාවගේ සුභසාධක පහසුකම් සැලසීම, මාර්ග වල පස් කණ්ඩි ඉවත් කිරීම ,අනතුරු දායක ගස් ඉවත් කිරීම සඳහා වියදම් වූ රු.188,953.03ක මුදල පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය වී ඇති හෙයින් මෙම මුදලින් ද්‍රව්‍ය ලබා ගත් ආයතන සඳහා මෙන්ම ද්‍රව්‍ය ලබා ගැනීමට පුද්ගලයින් විසින් අතින් වියදම් දරණ ලද මුදල් ආපසු ලබා දීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 21</u>**

මෙම පහසුකම් සැලසීම වෙනුවෙන් අදාළ වියදම් වලට අදාළ බිල්පත් හා ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ පසු පරීක්ෂා කර බලා බිල්පත් පියවීම සුදුසු බව සභා සම්මත විය.

04.රිටිදොළ වත්ත,වැලිහිඳ ,පැල්මඩුල්ල යන ස්ථානයේ එම්.එම්.දිමුතු යන අය විසින් පවත්වාගෙන යන බ්ලොක්ගල් වැඩ ව්‍යාපාරය හේතුවෙන් අසල්වැසි නිවාස වලට ශබ්ධය ගැටලුවක් වී ඇත.එබැවින් ශබ්ධය පිළිබඳ තත්ත්ව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙද අදාළ ව්‍යාපාර හිමිකරු වෙත දැනුම්දුන්නද එය ඉදිරිපත් නොකර අසල්වැසියන්ට පීඩාකාරී ලෙස පරිසර බලපත්‍ර රහිතව සිදුකරන ව්‍යාපාරයට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම සඳහා සුදුස තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 22</u>**

විධිමත් පරිසර බලපත්‍රයක් නොමැතිව තවදුරටත් ව්‍යාපාරය සිදු කරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ගගැනීම සුදුසු බව සභා සම්මත විය.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2025.12.29 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසා සිටියේ 2025.12.29 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාවේ නිර්දේශ අංක 11 වන ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතාවයන් සඳහා වාර්ෂිකව ලබා ගනු ලබන භාණ්ඩ සඳහා නිශ්චිත පිරිවිතරයන් ලැයිස්තුවක් සකස් කර කමිටු වාර දෙකක් ඇතුළත ලබා දීමට කටයුතු කරන ලෙස කාර්මික කමිටුව නිර්දේශය ලබා දෙන ලදි යන්න , ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතාවයන් සඳහා වාර්ෂිකව මිලදී ගනු ලබන සියලු භාණ්ඩ ලැයිස්තුවක්ද පිරිවිතරයන්ලබා ගත හැකි භාණ්ඩ ලැයිස්තුවක් හා ඊට අදාළ නිශ්චිත පිරිවිතරයන් සකස් කර කමිටු වාර දෙකක් ඇතුළත ලබා දීමට කටයුතු කරන ලෙස කාර්මික කමිටුව නිර්දේශය ලබා දෙන ලදි යනුවෙන් සංශෝධනය විය යුතුය. භාණ්ඩ මිලදී ගැනීමේ පරිවිතරයන් සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් පැන නැගුණ හෙයින් මෙම ගැටළු විසදා ගැනීම සඳහා ගරු සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.12.10)

ප්‍රසම්පාදන විෂය නිලධාරී ගරු සභාවට කැඳවා පරිවිතරයන් සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් සාකච්ඡා කරන ලදි.

කාරක සභාව ගරු සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ

යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.12.50)

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.11.01 සිට 2025.11.30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

ආදායම් ප්‍රගති වාර්තාවේ කසළ බදු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් පැන නැගුණ හෙයින් මෙම ගැටළු විසදා ගැනීම සඳහා ගරු සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.12.55)

මෙහිදී කසළ කළමණාකරණ විෂය නිලධාරී,ගිණුම් සම්බන්ධ විෂය නිලධාරීන් ගරු සභාවට කැඳවා කසළ බදු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයන් සාකච්ඡාවට බඳුන් කරන ලදි.

කාරක සභාව ගරු සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.1.20)

ආදායම් ප්‍රගති වාර්තාවේ කසළ බදු සම්බන්ධයෙන් 2025.12.31ට හිඟ ශේෂය සම්බන්ධව ගැටළුවක් ඇතිවී කාරක සභාවක් බවට පත්කර පැරණි කසළ බදු අයකිරීම සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීමට විෂය නිලධාරීන්ට නොහැකි වූ නිසා ආදායම් ප්‍රගති වාර්තාවේ සංඛ්‍යා සම්බන්ධව සෑහීමකට පත් නොවූ බවත් මේ සම්බන්ධයෙන් විගණන සම්බන්ධ උපදෙස් කඩිනමින් ලබා ගෙන නිවැරදි කර ගත යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසා සිටියේ කසළ බදු සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළුව විසඳීම සඳහා සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් යුත් අභ්‍යන්තර විගණන කමිටුවක් පත් කිරීම සුදුසු බවය.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**

*<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>*

මේ සභාව පටන් ගත් දිනයේ සිට විපක්ෂය නියෝජනය කරන පක්ෂ කිහිපයක් හැමෝම නොව පැල්මඩුල්ල ජනතාවට ආදරේ කරන හැඟිමක් තියෙන පක්ෂ අපිත් එක්ක එකතුවෙලා මේ සභාව කරගෙන යන්න උත්සහ කළත් තමන්ට බලය ගන්න බැහැ කියල හිතපු අය තමන්ට බහුතරය දිනාගන්න බැරිවෙච්ච හැම වෙලාවකම සභාවෙන් බැහැල ගියා.කමිටු පත් කළා කමිටුවක සභාපති ධූරයටත් තේරී පත් වුණා.පසුව එම කමිටුවෙනුත් ඉල්ලා අස්වුණා.තියපු කමිටු බොහොමයකට බහුතරයක් ආවේ නැහැ.සභාපති තුමනි මේ සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යවරයාට දන්වා නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකිනම් ඒ පිළිබඳව සළකා බලන ලෙස ඉල්ලා සිටිමි.

*<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ සුමේධ ලක්මාල් මැතිතුමා</u>*

අලුත් අවුරුද්දක මේ වගේ දෙයක් බලාපොරෝතතු වුනේ නැහැ.මේ අවුරුද්දේ ගැටළුවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වෙයි කියල බලාපොරොත්තු වුණා.කාර්මික කමිටුවේ හිටපු සභාපති විදියට හා මේ වසරේ සභාපති විදියට මම ඉල්ලීමක් කරනවා කමිටු පැවැත්වෙන දිනය දවස් දෙකකට කලින් වට්සැප් සමූහයට යොමු කරනවා එදිනට සහභාගී වන ලෙස කමිටු සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටිනවා.විපක්ෂය අයවැයට විරෝධය පළ කර සභාවෙන් පිටව ගියා ඒ පිළිබඳව කණගාටුව පළ කරනවා.මොකද කරන්න බැහැ කියනවට වැඩිය කරන්න පුළුවන්ද බැරිද යන්න අවුරුද්දක් දීල බලමු කියන මතයෙ තමයි මං ඉන්නෙ.

- **<u>සභාපතිතුමාගේ ස්තුති කිරීම.</u>**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.1.35ට පමණ සභාවේ කටයුතු අවසන් විය.
- ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2025-12-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව